ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2452/07 – 2025 සැප්තැම්බර් මස 02 වැනි අඟහරුවාදා – 2025.09.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2022/196.

කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.06.10 දිනැති හා අංක 2388/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.06.04 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 500, 5 වන මහල, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ලිපිනයෙහි පිහිටි මහවැලි කෘෂිකර්ම උපාධිධාරී සංගමය (ආර්. බී. පුංචිහේවා මයා ඇතුළු කෘෂිකර්ම නිලධාරීන් 17 දෙනා වෙනුවෙන්) සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 500, ලිපිනයෙහි පිහිටි, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/24/2024 හා 2025.06.11 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 අගෝස්තු මස 21 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදී ය.

IR/COM/04/2022/196
නඩු අංකය : A/24/2024

මහවැලි කෘෂිකර්ම උපාධිධාරි සංගමය,
(ආර්. බී. පුංචිහේවා මයා ඇතුළු කෘෂිකර්ම නිලධාරින් 17 දෙනා වෙනුවෙන්),
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
5 වන මහල,
අංක 500,
ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

පළමු පාර්ශ්වය

එදිරිව

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500,
ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

දෙවන පාර්ශ්වය

බේරුම්කරණ ප්‍රදානය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා IR/COM/04/2022/196 හා 2024.06.04 වන දිනැති ලිපියෙන් බේරුම්කරු වශයෙන් මා පත්කොට ඇත.

ඒ අනුව කම්කරු කොමසාරිස් ජනරාල් එච්.කේ.කේ. ඒ. ජයසුන්දර මහතාගේ IR/COM/04/2022/196 හා 2024.05.10 දිනැති ලිපියෙන් ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වශයෙන් දක්වා ඇත්තේ “ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 2007,2008,2009 වර්ෂ වල දී 25640.00-14X475-32290.00 වැටුප් පරිමාණයට බඳවා ගන්නා ලද ආර්. බී. පුංචිහේවා මයා ඇතුළු පහත නම් සඳහන් කෘෂිකර්ම නිලධාරින් 17 දෙනාගේ වැටුප් පරිමාණ 20490-10 X 325 - 18 X 475 - 32290.00 ලෙස සලකා අතීතයට බලපාන පරිදි වැටුප් සැකසීම මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.”

01. ආර්. බී. පුංචිහේවා
02. සමන් අබේරත්න
03. ඩී.ආර්.චේනකා ක්‍රිෂාන්ති
04. ජේ. එම් සුගත් ජයකඩු
10. සී. ඩී. එම්. ලියනආරච්චිගේ
11. ඒ. එම්. ඒ. යූ. කේ. අබේකෝන්
12. සී. පී.එල්.සූරියආරච්චි
13. ආර්.ඒ.ඩී.කේ.රාජපක්ෂ

05.නිහාල් ජයතිලක දිසානායක

06.ජේ. එම්.ඒ.කේ.ජයවීර

07. ජේ. එස්. බී. අබේසිංහ

08.බී.ජී.සෙනවිරත්න

09.එන්.කේ.ඒ. චමින්ද

14. ඩබ්. එම්. ඩී. සී.කේ.වලිසුන්දර

15. බී. ජී. කපිල කුමාර

16. යූ. ජී. ලක්ෂිකා මෙලානි

17. ඉන්දික රණවීර

ඉහත බේරුම්කරණයට අදාල විභාගය 2024.07.01 වන දින බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදී ආරම්භ කරන ලදි. එදින දෙපාර්ශ්වයට මෙම බේරුම්කරණ විභාගය ඉදිරියට පවත්වාගෙන යන ආකාරය පැහැදිලි කර දුනිමි. ඒ යටතේ ප්‍රථමයෙන් ම කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් මා වෙත ඉදිරිපත් කර ඇති යොමුව සංශෝධනය විය යුතු ද යන්න පළමු වන පාර්ශ්වයෙන් විමසා සිටි අතර ඔවුන් විසින් එය නිවැරදි බවටත් සංශෝධනයක් අවශ්‍යා නොවන බවටත් ප්‍රකාශ කරන ලදි. අනතුරුව මෙම කාර්මික ආරාවුල සම්බන්ධව වෙනත් අධිකරණයක නඩුවක් පවතින්නේ ද යන්න විමසූ අතර දෙපාර්ශ්වය විසින්ම එවැන්නක් නොමැති බව ප්‍රකාශ කරන ලදි. අනතුරුව මෙම විභාගය මාස 3ක් තුල නිම කල යුතු බවත් විධිමත් අධිකරණයක මෙන් සාක්ෂි සටහන් කර ගැනීමක් හෝ ලේඛන ගොනු කිරිමක් අපේක්ෂා නොකරන නමුත් දෙපාර්ශ්වයටම තමන් වෙනුවෙන් ඉදිරිපත් කිරීමට ඇති සියලු කරුණු හා විරෝධතා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන බවත්, දිවුරුම් ප්‍රකාශ මගින් කරුණු ඉදිරිපත් කරන්නේ නම් ඒ සඳහා අවස්ථාව ලබාදෙන බවත් පැහැදිලි කරන ලදි. පළමු වන පාර්ශ්වයට නිතිඥවරයෙකුගේ/නියෝජිතයෙකුගේ සහය ලබාගත හැකි බව දැන් වූ අතර දෙවන පාර්ශ්වය වෙනුවෙන් මහවැලි අධිකාරියේ නීති නිලධාරීට අමතරව නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ සහය ද ලබාගන්නා බව ප්‍රකාශ කෙරුණි.

එමෙන්ම පළමුවන පාර්ශ්වය, දෙවන පාර්ශ්වය වෙතින් මෙම බේරුම්කරණය අවසානයේ කිසියම් මූල්‍යාම සහනයක් අපෙක්ෂා කරන්නේ නම් එය ද නිසි පරිදි ගණනය කර දෙවන පාර්ශ්වයට පිටපතක් සහිතව ඉදිරිපත් කළ යුතු බව දැන්වූ අතර එම ඉල්ලීම පිළිබඳව දෙවන පාර්ශ්වයට විරෝධතා ඉදිරිපත් කල හැකි බවද පැහැදිලි කර දුනිමි.

ඒ අනුව 2024.07.01 ඇතුළුව දින 9ක් බේරුම්කරණ විභාගය පැවැති අතර එම දින පිළිවෙලින් 2024.08.08 , 2024.09.13, 2024.11.27. 2025.01.07, 2025.02.11. 2025.03.03, 2025.03.11, 2025.03.25 යන දිනයන් වේ. ලිඛිත දේශන සඳහා 2025.04.30 වන දින ලබා දුන් අතර, දෙපාර්ශ්වයේම ලිඛිත දේශන කාර්යාලයට ගොනු කරන ලෙසට උපදෙස් දුනිමි.

පළමු වන පාර්ශ්වය විසින් දෙවන පාර්ශ්වයට එරෙහිව අභියාචනාධිකරණයේ රිට් ආඥාවක් නිකුත් කරන මෙන් අභියාචනාධිකරණ නඩු අංක 160/2019 යටතේ නඩුවක් පවරා තිබුණ අතර, එම නඩුවේ නියෝගය 2022.03.03 වන දින නිකුත් කොට තිබුණි. එම අභියාචනාධිකරණ නියෝගයේ ඉල්ලුම්කරුවන්ට කම්කරු නීතිය යටතේ විකල්ප විසඳුම් සඳහා යා හැකි බැවින් ඒ පිළිබඳව පියවර ගන්නා ලෙසට පෙත්සම්කරුවන් වෙත (පළමු වන පාර්ශ්වය) නියෝග කරමින් නඩුව ගාස්තු රහිතව ප්‍රතික්ෂේප කර ඇත.

ඒ අනුව 2022.03.28 වන දින පළමු වන පාර්ශ්වය විසින් මැද කොළඹ කම්කරු කාර්යාලය වෙත සිය ඉල්ලීම් ලබා නොදීම සම්බන්ධව ප්‍රථම පැමිණිල්ල සිදුකර ඇත. එම පැමිණිල්ල පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුව විසින් දෙපාර්ශ්වය කැඳවා මූලික විභාගයක් පවත්වා ඇති අතර, කම්කරු කොමසාරිස් (කාර්මික සම්බන්ධතා) සමග ද විභාගයක් පැවැති බවත් ඉන්පසුව මෙය බේරුම්කරණය මගින් නිරවුල් කිරීම සඳහා දෙපාර්ශ්වය බේරුම්කරණ අංශයට යොමු කරන ලද බවත්, ගොනුව අනුව පැහැදිලි වේ.

මෙම බේරුම්කරණයේ පළමු පාර්ශ්වය වෙනුවෙන් එහි අංක 12 යටතේ ඉදිරිපත් වී සිටි සී. පී. එල්. සූරියආරච්චි යන අය ආරම්භයේ සිටම පෙනී නොසිටි අතර, එම නිලධාරියා සේවයෙන් ඉවත් වී විදේශ ගතවී ඇති බවට කරුණු අනාවරණය විය. එහිදී මා පළමු වන පාර්ශ්වයට උපදෙස් දෙන ලද්දේ විදේශගතව සිටින්නේ නම් විධිමත් පරිදි අත්සන් කරනු ලබන පෙරකලාසියක් මගින් බලය පැවරීමක් සිදු කල යුතු බවයි. එසේ නොවන්නේ නම් විශේෂ ඇටෝනි බලපත්‍රයක් මගින් ඔහු වෙනුවෙන් පෙනී සිටීම සඳහා හා කරුණු දැක්වීමට පුද්ගලයෙකු නම් කල යුතු බවයි. නමුත් එලෙස ඇටෝනි බලයක් හෝ පෙරකලාසියක් ඉදිරිපත් නොවීම හේතුවෙන් 2024.09.13 වන දින සී. පී. එල්. සූරියආරච්චි, 23/65/ඒ, 3 වන පියවර, අනුරාධපුර, ජාතික හැඳුනුම්පත් අංක 752572429V යන අය පළමු වන

පාර්ශ්වයේ සාමාජිකයෙකු වශයෙන් මින් ඉදිරියට නොසැලකීමටත් මෙම බේරුම්කරණ විභාගය අවසානයේ කිසියම් සහනයක් පළමු වන පාර්ශ්වය වෙත ලැබෙන්නේ නම් ඒ සඳහා සී. පී. එල්. සූරියආරච්චි මහතාට කිසිදු හිමිකමක් හෝ අයිතිවාසිකමක් නොමැති බවටත් තීරණය කොට පළමු පාර්ශ්වයේ සාමාජිකයන් 16 දක්වා අඩු කිරීමට තීරණය කරමි.

අනතුරුව දෙවන පාර්ශ්වය එනම් ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරිය විසින් මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරන බව නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරයා දැනුම් දෙන ලදි. ඒ අනුව 2023.08.08 වන දින දෙවන පාර්ශ්වය විසින් පළමුවන පාර්ශ්වයේ එන්.ජේ. දිසානායක (05) ජේ. එම්. සුගත් ජයකඩු (04) යන දෙදෙනා 2022.12.31 වන දින විශ්‍රාම ගොස් ඇති බවත්, තෙවෙනි නිලධාරියා වන ජේ. එස්. බී. අබේසිංහ (07) යන අය 2023.07.14 වන දින සේවයෙන් අස්ව ගොස් ඇති බවත්, එම තිදෙනා මෙම බේරුම්කරණ විභාග වන අවස්ථාවේ දී මහවැලි අධිකාරියේ සේවයේ නොකරන බැවින් සජීවී ආරාවුලක් (Live Dispute) නොමැති නිසා එම හේතුව මත කාර්මික ආරාවුල් පනතේ 19 සහ 17 (2) වගන්ති යටතේ මෙම බේරුම්කරණ විභාගයෙන් සහන ලබා ගැනීමට අයිතියක් නොමැති බවටත්, පළමු වන පාර්ශ්වය දීර්ඝ කාලයක් නිහඬව සිට මෙම ඉල්ලීම කර ඇති බවත්, එම හේතුව මත මෙම පැමිණිල්ල ඉවත දැමිය යුතු බවටත් මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරනු ලැබීය. ඊට ප්‍රතිවිරෝධතා පළමු පාර්ශ්වය ගොනු කල අතර එම මූලික විරෝධතා සම්බන්ධව බේරුම්කරු වශයෙන් මාගේ තීරණය 2024.08.30 වන දින ලබා දුන් අතර එහිදී ඉහත දැක් වූ 160/2019 යන අභියාචනාධිකරණ නඩුවේ නියෝගය 2022.03.03 ලද පසු 2022.03.28 වන දින පළමු වන පාර්ශ්වය සිය මූලික පැමිණිල්ල කම්කරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බවත් මූලික විරෝධතාවයට යටත් කල තිදෙනා කම්කරු දෙපාර්තමේන්තුවට මුල් පැමිණිල්ල සිදු කල අවස්ථාවේ දී සක්‍රිය සේවයේ යෙදී සිටි බැවින් මෙම බේරුම්කරණ විභාගය ආරම්භ කරන අවස්ථාව වන විට ඔවුන් සක්‍රිය සේවයේ නොසිටිය ද එම තිදෙනා පාර්ශ්වකරුවන් වශයෙන් ඇතුලත් කර ගැනීම දෝෂ සහගත නොවන බවට තීරණය කරමින් එම තිදෙනා සම්බන්ධයෙන් සජීවී ආරාවුලක් නොමැති බවට කර ඇති මූලික විරෝධතාවය ප්‍රතික්ෂේප කරන ලදි.

ඉන් අනතුරුව පළමු වන පාර්ශ්වයට මෙම කාර්මික ආරාවුල කුමක් ද යන්න පැහැදිලි කර දීමට අවස්ථාව ලබා දුනිමි. ඒ අනුව ඔවුන් පවසා සිටියේ මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් වර්ෂ 2007.2.26 වන දින ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ තනතුරු පුරප්පාඩු ගැසට් කල බවත් එහි අංක 2 යටතේ තුන්වන ශ්‍රේණියේ කෘෂිකර්ම නිලධාරීන් බඳවා ගැනීමට ඉල්ලුම්පත්‍ර කැඳවන ලද බවත්, එහි අදාල තනතුරේ වැටුප වශයෙන් රුපියල් 25640/14 X 475/32090.00 (මාසික) වශයෙන් වැටුප් හිමි බවට එම පුවත්පත් දැන්වීමට ඇතුලත් කල බවත්, ඒ අනුව ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරනු ලැබූ තමන් සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව කෘෂිකර්ම නිලධාරි වශයෙන් පත් කරනු ලැබූ බවත් කියා සිටින ලදි.

එලෙස 2007 වර්ෂයේ පළ කරන ලද පුවත්පත් දැන්වීම පරිදි ඉදිරිපත් වූ ඉල්ලුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කොට 2007 ජූනි මස හත්දෙනෙකු ද 2007 ඔක්තෝම්බර් මස දෙදෙනෙක් ද 2008 ජනවාරි මස දෙදෙනෙකු ද 2008 ජූනි මස එක් අයෙකු ද 2008 ජූලි මස තිදෙනෙකුද 2009 අගෝස්තු මස එක් අයෙකු ද ඇතුලුව 16 දෙනෙකු බඳවා ගත් බව ප්‍රකාශ කරනු ලැබීය. ඒ අනුව පළමුවන පාර්ශ්වයේ ඩී. ආර්. ඩබ්. ක්‍රිෂාන්ති, සී. ඩී. එම්. ලියනආච්චිගේ, ඒ. එම්. ඒ. යූ. කේ. අබේකෝන්, එන්. කේ. ඒ. සී. කොඩිවීර, (එන්.කේ. ඒ. චමින්ද), ආර්. බී. පුංචිහේවා, බී. ජී. කපිල කුමාර, ඩබ්. එම්. ඩී. සී.කේ.වලිසුන්දර යන අය 2007 ජූනි මස ද බී. ජී. සෙනෙවිරත්න, අයි. රණවීර යන අය 2007 ඔක්තෝම්බර් මසද ආර්. ඒ. ඩී. කේ. රාජපක්ෂ, ජේ. එම්. සුගත් ජයකඩු යන දෙදෙනා 2008 ජනවාරි ද එන්. ජේ. දිසානායක 2008 ජූනි ද ජේ. එම්. ඒ.කේ. ජයවීර ජේ. එස්. බී. අබේසිංහ, ඒ. එම්. එස්.අබේරත්න 2008 ජූලි ද යූ. ජී. එල් මෙලානි 2009 අගෝස්තු මස ද කෘෂිකර්ම නිලධාරි III තනතුරට බඳවාගත් බවත් තමන් සියලු දෙනා බඳවාගනු ලැබුවේ 2007 වර්ෂයේ කැඳවනු ලැබූ ඉල්ලුම්පත්‍ර මත බවත්, ප්‍රකාශ කරන ලදි. මෙම කෘෂිකර්ම නිලධාරින් III වන ශ්‍රේණිය සඳහා ඉදිරිපත් කරන ලද වැටුප් පරිමාණය ඒ වන විට ඉහල මට්ටමක පැවතිම හේතුවෙන් මේ සඳහා තමන් අයඳුම්කල බවත්, පුවත්පත් දැන්වීමේ සඳහන් වැටුප් පරිමාණය තමන් වෙත නිකුත් කළ පත්වීම් ලිපියට ඇතුලත් කල බවත් එම වැටුප බඳවා ගත් දින සිට වසර ගණනාවක් අඛණ්ඩව ගෙවූ බවත්, නියමිත වැටුප් වර්ධක ගෙවූ බවත් පසුව වර්ෂ 2015 දී තමන්ගේ වැටුප එම තනතුරට අදාල වැටුප නොව එම තනතුරේ 15 වන පියවරේ වැටුප බවත් සඳහන් කරමින් වැටුප් නිවැරදි කිරීම සිදු කරන බව දෙවන පාර්ශ්වය තමන් වෙත දන්වා තමන්ගේ වැටුප පහල වැටුප් තලයට ගෙන ආ බවත් එම හේතුව නිසා තමන් ලබමින් සිටි වැටුප, වෘත්තිය අයිතිවාසිකම් ද අහිමි වූ බවත් පළමු පාර්ශ්වය දන්වා සිටි අතර මේ සම්බන්ධයෙන් මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුලු ඉහල නිලධාරින් වෙත කලින් කලට වරින් වර අභියාචනා ඉදිරිපත් කල නමුත් කිසිදු සහනයක් නොලැබුණ බැවින් තමන් අභියාචනාධිකරණයේ පිහිට පැතු බවත් එම අභියාචනාධිකරණ තීන්දුවේ සඳහන් පරිදි කම්කරු නීතිය යටතේ සහන අපේක්ෂාවෙන් කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කොට මෙම ආරාවුල නිරවුල් කර ගැනීමට බේරුම්කරණ වෙත යොමු වූ බවත් ප්‍රකාශ කරන ලදි.

බේරුම්කරු වශයෙන් මා පළමු පාර්ශ්වය විසින් ඉහතින් සඳහන් කරන ලද III වන ශ්‍රේණියේ කෘෂිකර්ම නිලධාරි තනතුරු වලට අදාල පත්වීම් ලිපිවල පිටපත් පළමු පාර්ශ්වය විසින් 2024.07.15 වන දින ගොනු කර තිබුණ නිසා එම පත්වීම් ලිපි පරිශීලනය කල අතර එම

පත්වීම් ලිපි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සේවය කළ කේ. ඩබ්. අයිවන් සිල්වා මහතා අත්සන් කර තිබුණි. එම පත්වීම් ලිපි සියල්ලේම දෙවන කොන්දේසිය යටතේ පළමු පාර්ශ්වය විසින් දක්වා සිටින වැටුප් තලය වන 25640.00/14 X 475/ 32290.00 වැටුප් ක්‍රමයක් හිමිවන බවත්, ආරම්භක වැටුප 25640.00 ක් බවත් දක්වා ඇත. එම වැටුප් ක්‍රමයත් බඳවා ගැනීමට අදාල පුවත්පත් දැන්වීමේ සඳහන් වැටුපත් එක හා සමාන බව නිරීකෂණය විය.

ඉහත විස්තර කළ මූලික ඉදිරිපත් කිරිමට විරෝධතා වශයෙන් දෙවන පාර්ශ්වය විසින් සිය පිළිතුරු ප්‍රකාශය 2023.08.08 වන දින ගොනු කර ඇත. ඒ අනුව දෙවන පාර්ශ්වය කියා සිටින්නේ මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක DMS/A1/ වැටුප් හා 2006.12.11 දිනැති ලිපිය මගින් මහවැලි අධිකාරියට කළමනාකරණ සේවා අංක 30 ට අදාලව නව වැටුප් ව්‍යුහය අනුමත කිරීම සිදු කරන ලද බවත්, එම ලිපියේම 5 වන ඡේදය අනුව නව බඳවා ගැනීම් සිදුකල යුත්තේ වැටුප් ක්‍රමයන් හි ආරම්භක වැටුපට බවත්, එහි 7 වන ඡේදය අනුව කිසියම් පුද්ගලයෙක්ට වැරදීමක් හේතුවෙන් හෝ වැඩිපුර ගෙවීමක් සිදු කර ඇතිනම් එය සේවකයාගෙන් අප්‍රමාදව අය කර ගත යුතු බවත් පැහැදිලිව දක්වා ඇති බව කියා සිටී.

දෙවන පාර්ශ්වය කියා සිටින්නේ, මහවැලි අධිකාරිය සඳහා නව වැටුප් ව්‍යුහය 2006.12.11 වන දින අනුමත කල නමුත් එම ලිපියේ කොන්දේසි නිවැරදිව අර්ථ කථනය කර නොගෙන දෙවන පාර්ශ්වය විසින් III වන ශ්‍රේණියේ කෘෂිකර්ම නිලධාරින් නව බඳවා ගැනීම් සිදුකර ඇති බවත් නව බඳවා ගැනීමේ දී කෘෂිකර්ම නිලධාරීන්ගේ වැටුප 25640.00/14 X 675 / 32290.00 යටතේ වන වැටුප් පරිමාණය යටතේ බඳවා ගැනීම සිදුකර ඇති බවත්ය. (දෙවන පාර්ශ්වය විසින් දක්වා ඇති මෙම වැටුප් පරිමාණය වැරදිය. නිවැරදි වැටුප් පරිමාණය නම් 25640.00/14 X 475/32290.00 ය) ඒ අනුව තනතුරු 3 ක් සඳහා එම පුවත්පත් දැන්වීම පළ කල බවට දෙවන පාර්ශ්වයේ පිළිතුරු ප්‍රකාශයේ කියා සිටිය ද එලෙස තනතුරු 3 ක් සඳහා පුවත්පත් දැන්වීම පළ කල බව කිසිදු ආකාරයකින් සනාථ නොවේ.

එම වැටුප් පරිමාණයට 2007, 2008, 2009 වර්ෂවල කාර්ය මණ්ඩලය බඳවා ගත් බව දෙවන පාර්ශ්වය පිළිගන්නා අතර ඔවුන්ට ලබාදී ඇත්තේ MM 1-1 වැටුප් පරිමාණය වුවත් කෘෂිකර්ම නිලධාරි III වන ශ්‍රේණියට හිමි වැටුප් පරිමාණය JM 1-1 බවත් දෙවන පාර්ශ්වය කියා සිටී. ඔවුන් වැඩිදුරටත් කියා සිටින්නේ, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබා දුන් උපදෙස් අනුව නව වැටුප් ව්‍යුහයට අන්තර්ග්‍රහනය කල බවත් ඒ සම්බන්ධයෙන් නිලධාරින්ට අගතියක් සිදු නොකොට අදාල බඳවා ගැනිමේ පටිපාටියේ සඳහන් විධිවිධාන අනුව අන්තර්ග්‍රහනය සිදුකර වැඩිපුර ගෙවූ වැටුප් අය කිරීමකින් තොරව JM1-1 තනතුරට අදාල වැටුප ගැලපීම පමණක් සිදුකල බවයි.

දෙවන පාර්ශ්වය විසින් 2025.04.30 වන දින ගොනු කරන ලද ලිඛිත දේශනයේ 6 වන ඡේදය යටතේ වග උත්තරකාර මහවැලි අධිකාරිය විසින් කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ 2006.12.11 දිනැති ලිපියේ අන්තර්ගතය නිසි ආකාරව වටහා ගැනීමකින් තොරව මෙම පළමු පාර්ශ්වයේ නිලධාරීන් බඳවා ගත් බව පිළිගෙන ඇත. ඔවුන් කියා සිටින්නේ එම නිලධාරීන් බඳවා ගත යුතුව තිබුනේ 20490/10X325/18 X 475/32290.00 යන වැටුප් පරිමාණයට වුව ද එය නිවැරදිව සිදු නොවූ බවත් එම නිවැරදි කිරීම 2016.01.01 දින සිට සිදුකල බවත්ය.

බේරුම්කරු වශයෙන් මා හට මෙහි දී නිරීක්ෂණය වන්නේ,

> 2007 වර්ෂයේ පෙබරවාරි මස පළ කරන ලද පුවත්පත් දැන්වීම අනුව 3 වන ශ්‍රේණියේ කෘෂිකර්ම නිලධාරීන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතරින් අයදුම්කරුවන් කොටස් වශයෙන් 2007, 2008 හා 2009 යන අනුගාමී වර්ෂ 3 කදී බඳවා ගැනීම සිදු කරනු ලැබුවේ කෙසේ ද, එහි නීත්‍යානුකූලභාවය කුමක්ද යන්නයි. වසර 3 කට පෙර එනම් වර්ෂ 2007 දී පළ කල පුවත්පත් දැන්වීමකින් 2008 හා 2009 වර්ෂ වල නවක නිලධාරීන් බඳවා ගැනීමට රජයේ පවත්නා බඳවා ගැනීමේ පටිපාටිය අනුව කිසිදු ආයතනයකට හැකියාවක් නොමැත. එම නිසා එක් පුවත්පත් දැන්වීමක් පළ කර වසර 3 ක් තුල අවස්ථා ගණනාවක දී කෘෂිකර්ම නිලධාරීන් පත් කිරීම මුලුමනින්ම සාවද්‍ය ක්‍රියාවකි. එහි වගකීම එම පත්වීම් ලිපි අත්සන් කල අධ්‍යක්ෂ ජනරාල්වරයා හා එම බඳවා ගැනීමට අදාල අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මානව සම්පත්) ඇතුළු ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරීන් බාරගත යුතුය. අනිත් අතට පත්වීම් ලිපියේ දෙවන කොන්දේසිය යටතේ වැටුප් පරිමාණය සඳහන් කර ඇති අතර එම වැටුප් පරිමාණය සංශෝධනයකින් තොරව 2007, 2008, 2009 යන වර්ෂ තුනේම නිකුත් කල පත්වීම් ලිපි වලට ඇතුලත් වූයේ කෙසේ ද යන්න දෙවන පාර්ශ්වය පැහැදිලි කර නැත.

අනතුරුව පාර්ශ්වයන් සඳහා පළමු ප්‍රකාශ සහ ඊට අදාළ ලේඛන ද එම ප්‍රකාශ සඳහා විරෝධතා ද මතු කිරීම සඳහා අවස්ථාව ලබා දුනි. ඒ අනුව පළමු පාර්ශ්වය වෙත තමන්ගේ පත්වීමේ ලිපිය අනුව ආරම්භ වැටුප වශයෙන් රු.25640.00 ක මුදලක් ලද බවත් එතැන් සිට වසර ගණනාවක් එම වැටුප මත පදනම්ව වැටුප් වර්ධකය ගෙවූ බවත් කියා සිටී. දෙවන පාර්ශ්වය විසින් කළමනාකරණ සේවා

දෙපාර්තමේන්තුවේ DMS/1711/VOL v හා 2018.04.11 දිනැති ලිපිය අනුව 2015.12.31 වන දිනට හිමි විය යුතු වැටුප ගණනය කොට 2016.01.01 සිට එම වැටුප ලබා දුන් බවත් තමන්ට එදින සිට ලබා දුන් වැටුප පත්වීම් ලිපියේ සඳහන් වැටුප් පරිමාණයට වඩා අඩු බවත් JM 1-1 ට අදාළ රු.20490-10*325-18*475-32,290 යන වැටුප් පරිමාණය ලබා දුන් බවත් එම වැටුප් පරිමාණය ලබා දීම නිසා එතෙක් උපයාගෙන තිබූ වැටුප විශාල වශයෙන් අඩු වූ බවත් කියා සිටී. පළමු පාර්ශ්වය තවදුරටත් කියා සිටින්නේ තමන් ලබමින් සිටි වැටුප නව වැටුප් ව්‍යුහයකට ගැලපීම් සිදු කරන තෙක් වැටුප් වර්ධක ලබා නොදුන් බවත් එම හේතුව නිසා 2015 සිට මේ දක්වාම වැටුප් වර්ධකයන්හි අඩු වීමක් දක්නට ඇති බවයි. මේ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය කියා සිටින්නේ, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2006.12.11 වන දින කාර්ය මණ්ඩල අනුමත කිරීමෙන් අනතුරුව 2011.08.22 වන දින සේවක සංඛ්‍යාව අනුමත කිරීමට කටයුතු කර ඇති බවත් එහි සඳහන් වැටුප් ක්‍රමය සහ උසස් වීම් පරිපාටිය බඳවා ගැනීමේ පටිපාටියට ඇතුලත් කරන ලෙසට දන්වා සිටි බවත් ඒ අනුව පළමු වන පාර්ශ්වයේ නිලධාරීන් වෙත ලබා දී තිබූ වැරදි සහගත වැටුප් පරිමාණය නිවැරදි කරන ලද බවත්ය. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ ජාතික වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව DMS/1711/VOL v හා 2018.11.04 දිනැති ලිපියෙන් ලබාදුන් උපදෙස් අනුව කාර්ය මණ්ඩල බඳවා ගැනීම් නිවැරදි කිරීමේ දී හෝ වැටුප් පරිවර්ථන නිවැරදි කිරීමේ දි සේවකයින්ට වැඩිපුර ගෙවා ඇත්නම් එය අඩු කර ගැනීමට කටයුතු කළ යුතු බවට ලිඛිත නියෝග ලද බව කියා සිටී. ඒ අනුව පළමු පාර්ශ්වයේ නිලධාරින්ට ගෙවන ලද ඉහළ වැටුප් තලය හේතුවෙන් ඔවුන් වෙත වැඩිපුර මුදලක් ගෙවා ඇති අතර එම වැඩිපුර ගෙවන ලද මුදල අය කර ගැනීමක් සිදු නොවූ බව ද එලෙස අය කර ගනු නොලැබුවේ මගේ අංක SA/ADM/23/03/SOR/1/PROPOSAL 2018.12.27 දිනැති ලිපියෙන් හිටපු අධ්‍යක්ෂ ජෙනරාල් ආචාර්ය ඩී. එම්. එස්. දිසානායක මහතා විසින් වැඩිපුර ගෙවන ලද මුදල් අය කර නොගන්නා ලෙසට සියලුම අධ්‍යක්ෂවරුන් සහ සියලුම නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුන් සහ සියලුම අංශ ප්‍රධානින් වෙත ලබා දුන් ලිඛිත උපදෙස් අනුව බව කියා සිටී. එම ලිපිය දෙවන පාර්ශ්වය විසින් වී - 4 වශයෙන් සලකුණු කොට මෙම බේරුම්කරණ විභාගයට ඉදිරිපත් කොට ඇත.

දෙවන පාර්ශ්වය දිගින් දිගටම කියා සිටින්නේ මෙම වැටුප් සංශෝධනය සිදු කරනු ලැබුවේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් අනුව බවයි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට එකඟ වීම හැර එම උපදෙස් ඉක්මවා යාමට සිය ආයතනයට හැකියාවක් නොමැති බැවින් කාර්ය මණ්ඩලයේ කෘෂිකර්ම නිලධාරි පමණක් නොව තවත් නිලධාරින් 650 කගේ පමණ වැටුප් ගැටළුව මතුව ඇති බව ද දෙවන පාර්ශ්වය කියා සිටී. මෙම තත්වය පැහැදිලි කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු කැඳවීමට තිරණය කරමි. ඒ අනුව 2025.02.11 වන දින කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරි මොහාන් දීපලාල් සමරවීර මහතා බේරුම්කරණයේ පෙනී සිටින ලදී. එම නිලධාරි මහතාට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා වෙනුවෙන් කරුණු පැහැදිලි කිරිමක් කළ හැකි බව ප්‍රකාශ කිරිම හේතුවෙන් ඔහුගෙන් තොරතුරු විමසීමට තිරණය කරමි. ඒ අනුව එම නිලධාරි මහතා ප්‍රකාශ කර සිටියේ කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව 2006.12.11 දින DMS/A 1/ වැටුප් නැමති ලිපිය මඟින් ඇමුණුම් 2 කින් සමන්විතව චක්‍රලේඛ උපදෙස් මහවැලි අධිකාරිය වෙත ලබා දී ඇති බවයි. එම උපදෙස් අනුව කාෂිකර්ම නිලධාරි 3 ශ්‍රේණිය JM 1- 1 වැටුප් කාණ්ඩයට අයත් බවත් නවක නිලධාරීන් බඳවා ගැනීමේ දි ආරම්භක වැටුපේ ද දැනට සේවයේ නියුක්ත නිලධාරින් අන්තර්ග්‍රහනයේදී ඊට අදාළ වැටුප් තලය ලබා දිය යුතු බව පැහැදිලි කර ඇති බව කියා සිටී. නමුත් 2007 වර්ෂයේ දී කෘෂිකර්ම නිලධාරි iii ශ්‍රේණියට බඳවා ගැනීමේ JM 1 - 1 හි ආරම්භක වැටුප් පියවරට බඳවා ගත යුතු වුවත් ඔවුන් බඳවා ගෙන ඇත්තේ JM වැටුප් කාණ්ඩයේ 15 වන වැටුප් පියවර වන රු.25,640.00 ට බව ඔවුන්ට නිරීක්ෂණය වී ඇති බවයි. එම පියවර ලබා දී ඇත්තේ ඒ වන විටත් කෘෂිකර්ම නිලධාරි තනතුරේ සේවය කරන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා ය. මෙම තොරතුරු කළමනාකාරණ සේවා දෙපාර්තමේන්තුවට ලැබීමෙන් අනතුරුව ඔවුන් විසින් 2016.01.11 සහ DMS/1711/VOL/viii ලිපි මඟින් බඳවා ගැනීම වැරදි සහගත ලෙස සිදුකර ඇති බවත් 2018.04.11 දිනැති DMS/1711/VOL/v ලිපිය මඟින් වැටුප් නිවැරදි කරන ආකාරය පිළිබඳව උපදෙස් ලබා දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. එලෙස ලබා දුන් උපදෙස් ක්‍රියාත්මක කිරීමේ දී කිසියම් පැහැදිලි කිරිමේ අවශ්‍යතාවයක් මතු වී නම් ඒ සඳහා උපදෙස් ලබා දීමට ද ඔවුන් සුදානම් බව ලිපි වලට ඇතුලත් කර ඇති බව කියා සිටී. එම නිලධාරි මහතාගේ ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ දෙවන පාර්ශ්වකාර මහවැලි සංවර්ධන අධිකාරිය විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිඛිත උපදෙස් නිසි ආකාරව අධ්‍යයනය කර නොමැති බවයි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ 2006.12.11 දිනැති DMS/A 1/ වැටුප් නැමති ලිපියේ නිවැරදිව අවබෝධ කරගනු ලැබුවේ නම් 2007 පෙබරවාරි 26 දිනැති පුවත්පත් දැන්වීමේ කාෂිකර්ම නිලධාරි තනතුර වෙනුවෙන් වූ වැටුප් පරිමාණය ඇතුලත් නොකරනු ඇත.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලද මෙම පැහැදිලි කිරීම් වලින් පසුව බේරුම්කරු වශයෙන් මා බේරුම්කරණ අංශයේ සහකාර කම්කරු කොමසාරිස්ගේ අංක A/24/2024 හා 2025.02.13 දිනැති ලිපිය මඟින් දෙවන පාර්ශ්වයේ එනම් මහවැලි සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් පහත සඳහන් අංක 1 සිට 6 දක්වා වූ කරුණු ලිඛිතව පැහැදිලි කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී. එම කරුණු නම්

1. 2007, 2008, 2009 වර්ෂ වල අදාළ කෘෂිකර්ම නිලධාරින් 3 වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා මහවැලි සංවර්ධන අධිකාරිය විසින් කළමනාකාරණ සේවා දෙපාර්තමේන්තුවට/ ජාතික වැටුප් කොමිසමට බඳවා ගැනීම සඳහා අනුමැතිය ඉල්ලා යවන ලද ලිපි වල සහතික පිටපත්.

2. ඉහත1 සඳහා එම ආයතන වලින් ලද පිළිතුරු වල සහතික පිටපත්

3. 2007, 2008,2009 වර්ෂ වල කෘෂිකර්ම නිලධාරීන් බඳවා ගැනිම සඳහා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවල සහතික පිටපත්

4. ඉහත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සඳහා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණ වල සහතික පිටපත්

5. 2007,2008 හා 2009 යන වර්ෂ වල කෘෂිකර්ම නිලධාරින් බඳවා ගැනීම සඳහා වු පුවත්පත් දැන්වීම් සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තිරණය සහ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලද ලිපි වල සහතික පිටපත්.

6. ඉහත දැක්වු වර්ෂ වලට අදාළව කෘෂිකර්ම නිලධාරීන් බඳවා ගැනීමට අදාළව පළ කළ පුවත්පත් දැන්වීම් වල සහතික පිටපත්.

යන තොරතුරු ඉල්ලා සිටිය ද එම කිසිඳු තොරතුරක් දෙවන පාර්ශ්වය විසින් ලබා නොදුන් අතර ඒ වෙනුවට කරුණු පැහැදිලි කරදීම සඳහා අවස්ථාවක් ලබා දෙන ලෙසට ඉල්ලීමක් කරනු ලැබීය. ඒ අනුව 2025.03.03 වන දින දෙපාර්ශ්වය කැඳවූ අතර දෙවන පාර්ශ්වය වෙනුවෙන් මහවැලි අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්) පෙනී සිටි අතර මා විසින් ඉල්ලා යවන ලද තොරතුරු අධිකාරිය සතුව නොමැති බවත් සෑම වසර 5 කට වරක්ම මහවැලි අධිකාරිය විසින් පැරණි ලිපි ගොනු ලේඛනාගාරයට යවන අතර ලේඛනාගාරය තුළ එම ලිපි ගොනු සොයා ගැනීමේ අපහසුතාවයක් ඇති බව ප්‍රකාශ කරන ලදී. ඒ අනුව බේරුම්කරු විසින් දන්වා සිටියේ ඉල්ලා ඇති තොරතුරු ලබා නොදීම හේතුවෙන් විභාගය අවසානයේ දී දෙවන පාර්ශ්වයට අගතික් සිදු වුවහොත් එහි වගකීම ඔවුන් දැරිය යුතු බවයි.

එමෙන්ම වැඩිදුරටත් ඇය කියා සිටියේ 2007, 2008, 2009 වර්ෂ වල අධ්‍යක්ෂ මණ්ඩල තිරණ පරීක්ෂා කර බැලුව ද කෘෂිකර්ම නිලධාරි iii වන ශ්‍රේණියට බඳවා ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණවල සඳහන්ව නොමැති බවයි. එම නිලධාරිනිය නැවතත් 2025.03.25 වන දින කැඳවූ අතර එහි දි ඇය ප්‍රකාශ කර සිටියේ ඇය පෙර දින ප්‍රකාශ කළ පරිදිම කෘෂිකර්ම නිලධාරීන් බඳවා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබා ගත යුතු වුවත් එවැන්නක් සොයා ගත නොහැකි බවයි. එමෙන්ම පුවත්පත් දැන්වීම් පළ කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතියක් ලබා නොගත් බවත් එවැනි අවශ්‍යතාවයක් නැති බවත් කියා සිටින ලදී. 2007, 2008 සහ 2009 යන වර්ෂ වල කෘෂිකර්ම නිලධාරින් බඳවා ගනු ලැබුවේ 2007 වර්ෂයේ පළ කළ එක් පුවත්පත් දැන්වීමකින් ද යන ප්‍රශ්නය මතු කළ පසු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරිය ප්‍රකාශ කර සිටියේ, එක් පුවත්පත් දැන්වීමකින් මෙම බඳවා ගැනීම් සිදු කර ඇති බවයි. 2007 වර්ෂයේ පුවත්පත් දැන්වීමකින් 2008 සහ 2009 වර්ෂ වල බඳවා ගැනීම් කළ හැකි ද යන ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් ඇය කියා සිටියේ එක් පුවත්පත් දැන්වීමකින් වසර කිහිපයක නව නිලධාරීන් බඳවා ගැනිම් සිදු කළ නොහැකි බවත් 2007 කණ්ඩායමක් සහ 2008 කණ්ඩායමක් සහ 2009 කණ්ඩායමක් වශයෙන් බඳවා ගැනීමට කිසිසේත්ම කළ නොහැකි බවයි. එමෙන්ම 2007 වන විට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 බලාත්මක හෙයින් එයට පටහැනිව මෙම බඳවා ගැනීම් සිදු කර ඇති බව ද ඇය පිළිගනී. 2006 අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ සංශෝධනය DMS 30(1) 2009.06.01 දිනැතිව ලද බවත් එම සංශෝධනය අනුව කෘෂිකර්ම නිලධාරින්ගේ වැටුප් ගැලපීම කිරීමට නොහැකි තත්වයක් උදාවී තිබු නිසා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් උපදෙස් පැතු බවත් ඒ අනුව ඔවුන් විසින් දුන් උපදෙස් අනුව මෙම කෘෂිකර්ම නිලධාරීන් බඳවා ගැනීම JM 1-1 වැටුප් කාණ්ඩයේ ආරම්භක වැටුප වන රු.20,490.00 වැටුප මත තබා අදාළ ගැලපීම් සිදු කළ බවයි. ඇගේ ප්‍රකාශයෙන් 2011 දී මෙම ගැටළුව අනාවරණය වු බවත් 2013 වන තෙක් ඒ පිළිබඳව තීරණයක් නොගත් බවත් කියා සිටී. 2015.12.31 දිනට වැටුප් ගැලපීම් සිදු කරන ලෙසට 2018.04.01 දින DMS/1711/VOL v ලිපියෙන් උපදෙස් ලැබෙන තෙක් කිසිදු පියවරක් නොගත් බව කියා සිටි. ඇය තවදුරටත් කියා සිටින්නේ හිටපු අධ්‍යක්ෂ ජෙනරාල් ඩී. එම්. එස්. දිසානායක මහතා විසින් නිකුත් කළ වි-4 වශයෙන් සළකුණු කළ චක්‍රලේඛනය හේතුවෙන් වැඩිපුර ගෙවු වැටුප් අය කර ගැනීම මුලුමනින්ම අත්හිට වූ බැවින් මෙම ගැටළුව තවත් උග්‍ර වු බවයි.

එමෙන්ම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු උපදෙස් වලට පටහැනිව 2007, 2008 සහ 2009 වර්ෂ වල බඳවා ගැනීමක් සිදු කළේ නම් එය මහවැලි අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශයට හෝ විගණකාධිපති දෙපාර්තමේන්තුවට හෝ අනාවරණය කර

ගැනීමට නොහැකි වීම සම්බන්ධයෙන් ප්‍රශ්න කළ අතර එය එම දෙපාර්ශ්වයටම මහ හැරී ඇති බව ද පිළිගනී. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරිය කියා සිටින්නේ කෘෂිකර්ම නිලධාරීන් III වන ශ්‍රේණියේ නිලධාරීන්ට සමගාමීව ඉංජිනේරුවරුන් බඳවා ගැනීමක්ද සිදු වූ බවත් ඉංජිනේරුවරුන්ට ද මේ ආකාරයෙන්ම වැටුප් ගැටලුවක් මතුව තිබූ නමුත් මහවැලි අධිකාරියත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවත් එක්ව එම ගැටළුව විසඳූ බවයි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් ලබා දෙන ලද සමස්ථ ප්‍රකාශයම සාරාංශ ගත කළ විට ඉතා පැහැදිලි වන්නේ දෙවන පාර්ශ්වයේ පරිපාලන දුර්වලතා, නොසැලකිල්ල සහ චක්‍රලේඛ උපදෙස් අනුගමනය නොකිරීමත් රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් වලින් තොරව කටයුතු කිරීමත් නිරීක්ෂණය වන බවයි.

කළමනාකරන සේවා දෙපාර්තමේන්තු චක්‍ර ලේඛවලින් දෙවන පාර්ශ්වය තම ආයතනයට වාසිදායක උපදෙස් පමණක් ක්‍රියාත්මක කිරීමටත් සෙසු උපදෙස් ඉවතලීමටත් කටයුතු කර ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් වැටුප් වශයෙන් වැඩිපුර ගෙවීමක් කර ඇත්නම් එය ආපසු අයකර ගත යුතු බවට ලිඛිත උපදෙස් දී තිබියදීත් දෙවන පාර්ශ්වයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් චක්‍රලේඛනයක් නිකුත් කර එම අයකිරීම් අත්හිටුවා ඇත. එමෙන්ම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ඔවුන්ගේ උපදෙස් සම්බන්ධව කිසියම් විරෝධයක් හෝ යෝජනාවක් ඇත්නම් එය ඉදිරිපත් කරන ලෙසට අවස්ථා ගණනාවකදී දන්වා තිබුණද ඒ සම්බන්ධ කිසිදු පියවරක් ගෙන නොමැත.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2006.12.11 වන දින අංක DMSA/A1/වැටුප් චක්‍රලේඛනය නිකුත් කිරීමෙන් පිළිවෙලින් 2011.08.22, 2013.06.12, 2016.01.11, 2016.04.25, 2018.04.11 දිනැති ලිඛිත උපදෙස් ලබාදී තිබුණ ද දෙවන පාර්ශ්වය ඒවා නිසි පරිදි අධ්‍යනය කොට ඒ අනුව පියවර ගෙන නොමැති බව නිරීක්ෂණය වේ. විශේෂයෙන් 2016.01.11 වන දින අංක DMS/1711/ VOL iii T ලිපිය මගින් “මෙම උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම ආයතනය විසින් කරන ලද වැරුද්දක් බව නිරීක්ෂණය කරන අතර ....” යනුවෙන්ද 2018.04.11 වන දින DMS/1711/VOL v ලිපියෙන් “ ඔබගේ ලිපියේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අභ්‍යන්තර පරිපාලන දෝෂයන් හේතුවෙන් සිදු වී ඇති වැටුප් විෂමතාවය පිළිබඳව ....” යනුවෙන් අවස්ථා දෙකකදී දෙවන පාර්ශ්වයේ පරිපාලන තීරණ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ දෝෂ දර්ශනයට ලක්වී ඇත. නමුත් එම දෝෂ දර්ශන පිළිබඳව මහවැලි අධිකාරියේ ඉහළ කළමනාකාරීත්වය හෝ රේඛීය අමාත්‍යාංශය කිසිදු පියවරක් ගෙන නොමැත.

බේරුම්කරු වශයෙන් මා කෘෂිකර්ම නිලධාරීන් බඳවා ගැනීමේ ගැටළුව දෙවන පාර්ශ්වයට විසඳාගත හැකිව තිබූ අවස්ථා පිළිබඳව ඉදිරිපත් වූ සාක්ෂි හා ලේඛන අනුව සොයා බැලීමි. ඒ අනුව කෘෂිකර්ම නිලධාරීන් බඳවාගත් 2007 වර්ෂයේදී සිට මුල් වර්ෂ කිහිපය තුළ සිදු වූ වරද නිවැරදි කර ගැනීමට අවස්ථාවන් එකොළහක් (11) තිබූ බව නිරීක්ෂණය විය. එම අවස්ථාවන් නම්,

1. කෘෂිකර්ම නිලධාරීන් මුලින්ම බඳවා ගැනීම කර ඇත්තේ 2007 වර්ෂයේ ජුනි මසය. දෙවන බඳවා ගැනීමේ 2007 ඔක්තෝම්බර් සිදුකර ඇති අතර එම අවස්ථාවේදී මුල් වරද අනාවරනය කර ගැනීමට හැකියාව තිබුණි. ඒ ආකාරයටම 2008 වසරේ ජනවාරි බඳවා ගන්නා අවස්ථාවේදී 2007 වර්ෂයේ අවස්ථා දෙකකදී සිදු වූ වරද අනාවරණය කර ගැනීමට තිබුණි. එසේත් නැත්නම් 2008 වසරේ ජුනි හෝ ජූලි මස කරන ලද බඳවා ගැනීම් වලදී මුල් අවස්ථාවේදී සිදු වූ වරද හඳුනා ගැනීමට තිබුණි. 2007 වසරේ අවස්ථා දෙකකදීත් 2008 වසරේ අවස්ථා තුනකදීත් සිදුවූ දෝෂ අවසාන වරට බඳවාගත් 2009 වසරේදී නිවැරදි කිරීමට අවස්ථාව තිබුණි. නමුත් මෙම අවස්ථා සියල්ල දෙවන පාර්ශ්වය මහ හැර ඇත.

2. නවක නිලධාරීන් වශයෙන් බඳවාගත් කෘෂිකර්ම නිලධාරින්ගේ පරිවාස කාලය වසර 3ක් බව ඔවුන් වෙත නිකුත් කරන ලද පත්වීම් ලිපියේ 3 වන ඡේදයේ දක්වා ඇති නිසා එම පරිවාස කාලය ඇතුලත බඳවා ගැනීම නිවැරදි කිරීමට අවස්ථාව තිබුණි.

3. පරිවාස කාලය අවසානයේදී ස්ථිර සේවයට ඇතුලත් කරන බවට හෝ සේවයේ ස්ථිර කරන බවට ලිපියක් නිකුත් කළ යුතු අතර එම ලිපිය නිකුත් කරන අවස්ථාවේදී මෙම වරද අනාවරණය කර ගැනීමටත් නිවැරදි කිරීමටත් අවස්ථාව තිබුණි.

4. නවක නිලධාරීන් බඳවා ගැනීමෙන් පසු ඔවුන්ගේ වැටුප් සකස් කිරීම සඳහා පත්වීම් ලිපියේ පිටපතක් ගිණුම් අංශය වෙත යැවෙන හෙයින් පරිපාලන අංශයෙන් අනාවරණය නොවූ පරිපාලන දෝෂය මූල්‍ය අංශයට අනාවරණය කර ගැනීමට අවස්ථාව තිබුණි. නමුත් එය සිදු වී නැත.

5. නවක නිලධාරීන් වශයෙන් බඳවාගත් එක් එක් නිලධාරියා වෙනුවෙන් පුද්ගලික ලිපිගොනුවක් ආරම්භ කරන බැවින් එම පුද්ගලික ලිපිගොනුව ආරම්භ කරන අවස්ථාවේදී මෙම දෝෂය හඳුනාගැනීමට අවස්ථාව තිබුණි.

6. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් 2009.06.01 දින DMS//30 (1) චක්‍රලේඛනය මගින් නව වැටුප් ව්‍යුහය හඳුන්වාදෙන අවස්ථාවේදී මෙම දෝෂය හඳුනාගෙන නිවැරදි කිරීමට තිබුණි.

7. 2011.08.22 වන දින නව කාර්ය මණ්ඩල අනුමැතිය සම්බන්ධව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛනය ලද අවස්ථාවේදී වරද අනාවරණය කරගෙන නිවැරදි කිරීමට තිබුණි.

8. මෙම මුල් කාලය තුළ කෘෂිකර්ම නිලධාරීන් වැටුප් ණය, ආපදා ණය වැනි සිය වැටුපෙන් ණය වාරික අයකර ගන්නා ලෙස ඉල්ලමින් මූල්‍ය සහන අයදුම්කරන අවස්ථාවලදී මෙම වරද අනාවරණය කර ගැනීමටත් නිවැරදි කිරීමටත් තිබුණි.

9. මෙම කෘෂිකර්ම නිලධාරීන් වෙනත් අයෙකුට ඇපකරුවෙකු වශයෙන් පෙනී සිටින අවස්ථාවකදී මෙම දෝෂය අනාවරණය කර ගැනීමට ඉඩ තිබුණි.

10. වාර්ෂික වැටුප් වර්ධක ලබාදීමේදී මෙම දෝෂය හඳුනා ගැනීමට ඉඩ තිබුණි.

11. කෘෂිකර්ම නිලධාරීන් වෙනුවෙන් EPF/ETF ගණනය කරන අවස්ථාවේදී මෙම දෝෂය හඳුනා ගැනීමට අවස්ථාව තිබුණි.

ඉහත අවස්ථා සියල්ලම දෙවන පාර්ශ්වය විසින් මඟ හැර ඇති අතර එය ඔවුන් අතින් සිදු වූ පරිපාලන දෝෂයක් වශයෙන් ඉතා සරල ලෙස අර්ථ ගැන්වීමට කටයුතු කර ඇත.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් අනුව වැටුප් පරිමාණය සංශෝධනය කරනු ලැබුවේ නම් ඒ අනුව ඔවුනට ලබා දුන් පත්වීම් ලිපියද සංශෝධනය කළ යුතු වේ. නමුත් පළමු පාර්ශ්වය කියා සිටින්නේ, එවැනි සංශෝධනය සිදු නොකළ බවයි. දෙවන පාර්ශ්වය ද එය පිළිගනී.

කෘෂිකර්ම නිලධාරීන් බඳවාගත් 2007 වර්ෂයේ සිට මේ දක්වා සේවයේ යෙදී සිටි මහවැලි සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරුන් ඇතුළු ඉහළ පරිපාලන නිලධාරීන්ට එරෙහිව මෙම සිද්ධිය පාදක කරගෙන ආයතන සංග්‍රහයට අනුකූලව විනය ක්‍රියාමාර්ගයන් රේඛීය අමාත්‍යාංශය මගින් ගත යුතුව තිබූ බව නිරීක්ෂණය කරමි.

ආයතන සංග්‍රහයේ දෙවන කොටසේ දැක්වෙන වැරදි පිළිබඳව වන පළමුවන උපලේඛනයේ අංක 7,9,10.15 හා 16 යන වැරදි මෙම නිලධාරීන් විසින් සිදුකර ඇති නිසා ඔවුන්ට ඉතා පැහැදිලිව චෝදනා පත්‍රයක් නිකුත් කළ හැකිව තිබුණි. නමුත් මේ සම්බන්ධව රේඛීය අමාත්‍යාංශය හෝ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හෝ වැටුප් කොමිසම හෝ කිසිදු නිර්දේශයක් ලබාදී ඇති බවක් නොපෙනේ.

මහවැලි අධිකාරියේ අභ්‍යන්තර පරිපාලනමය දෝෂය මුල් අවස්ථාවේදී ඉතාම පහසුවෙන් විසඳා ගැනීමට අවස්ථාව තිබුණි. එය විසඳන ආකාරය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/E1/14/7/131/1 හා 2011.08.22 ලිපිය මගින්ද ජාතික වැටුප් කොමිසමේ අංක NPC/8/11/302/SR හා 2014.07.22 දිනැති ලිපියෙන්ද (මෙම ලිපියේ පිටපතක් මහවැලි අධිකාරියට යවා නොමැති අතර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වෙත යවා ඇත) දෙවන පාර්ශ්වයට දන්වා තිබුණ ද ඒ පිළිබඳ දැඩි අවධානයක් යොමු නොකිරීම හේතුවෙන් මෙම අර්බුදය උග්‍ර වී ඇත.

ඉහත සියලු කරුණු කාරණාවලින් අනතුරුව පළමුවන පාර්ශ්වයත් දෙවන පාර්ශ්වයත් ඉදිරිපත් කළ ලිඛිත දේශන කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමි. පළමුවන පාර්ශ්වය විසින් සාක්ෂි විශ්ලේෂණයකින් අනතුරුව ඔවුන් විසින් 2025.02.05 වන දින මෙම බේරුම්කරණ විභාගයට ඉදිරිපත් කරනු ලැබූ මූල්‍යමය හානියට අදාළ ලේඛනය අනුසාරයෙන් කරුණු ඉදිරිපත් කර ඇත. එම මූල්‍යමය හානිය යටතේ 2016.01.01 දින සිට 2024.12.31 වන දින දක්වා එක් එක් නිලධාරියාට වූ මූල්‍යමය හානිය යටතේ හිඟ මූලික වැටුප, හිඟ නිවාඩු දීමනා, හිඟ වෘත්තීය දීමනා, අහිමි වූ තීරු බදු සහන හිමි ආනයන බලපත්‍රයේ වටිනාකම, අහිමි වූ ආයතනික දායකත්වය EPF හා අහිමි වූ ETF වශයෙන් ශීර්ෂ 6ක් යටතේ සිදු වූ හානිය ගණනය කර ඇත. මෙම සංඛ්‍යා තොරතුරු පළමුවන පාර්ශ්වය විසින් ලබාගෙන ඇත්තේ ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශයෙන් හා කලාප කාර්යාලවලින් බව දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් ගිණුම් නිලධාරි පිළිගෙන ඇත. ඒ අනුව එම සංඛ්‍යාවන් නිවැරදි බව පිළිබඳව සෑහීමකට පත්වෙමි.

පළමුවන පාර්ශ්වයට 2025.01.01 සිට ලිඛිත දේශණ ඉදිරිපත් කරන ලද 2025.04.30 දක්වා ඔවුන්ට සිදු වූ මූල්‍යමය හානිය ගණනය කර සිය ලිඛිත දේශනය සමඟ ඉදිරිපත් කිරීමට අවස්ථාව තිබූ නමුත් එලෙස ඉදිරිපත් කොට නොමැත.

එමෙන්ම දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත දේශණයේ අංක 6 යටතේ බඳවා ගැනීම නිසි ආකාරව සිදු නොවූ බව පිළිගෙන ඇති අතර අංක 14 යටතේ නැවත අයකර ගැනීම් සිදු නොකළ බව පිළිගෙන ඇත.

එමෙන්ම අවසන් ලිඛිත දේශණයේ මූලික විරෝධතාවයක් ඉදිරිපත් කර ඇති අතර මුල් අවස්ථාවේදී ඉදිරිපත් කළ මූලික විරෝධතාවයට අමතරව තවත් නිලධාරීන් ගණනාවක් ඇතුලත් කර තිබුණද විභාගය අවසානයේ ඉදිරිපත් කළ මූලික විරෝධතාවයක් වීම හේතුවෙන් එය කිසිසේත්ම පිළිගත නොහැකි හෙයින් එම මූලික විරෝධතාවය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරමි. දෙවන පාර්ශ්වය, පළමුවන පාර්ශ්වය ඉල්ලා ඇති හිඟ වැටුප් අහිමි වූ තීරු බදු සහන, වාහන ආනයන බලපත්‍රය, හිඟ නිවාඩු දීමනා, හිඟ වෘත්තීය දීමනා, අහිමි වූ ETF, EPF ගෙවීම් පිළිබඳ විරෝධතා දක්වන්නේ එක් එක් නිලධාරියා ඉදිරිපත් කර ඇති ඉල්ලීම පිළිබඳව නොව සමස්ථ ඉල්ලීම පිළිබඳවයි. කෙසේ වෙතත් දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වයේ නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ට හිමි වැටුපට වඩා ඉහළ වැටුපක් ගෙවීම හේතුවෙන් හා ඊට අදාළව ETF හා EPF ගෙවීමෙන් රුපියල් 9,914,529.50 ක් මහවැලි අධිකාරියට වැය වී ඇති බව කියා සිටි නමුත් එම මුදල සම්බන්ධව වෙනත් කිසිදු ඉල්ලීමක් කර නොමැත.

පළමුවන පාර්ශ්වය මෙම බේරුම්කරණ විභාගය අවසානයේ තමන්ට හිමිවිය යුතු වැටුප් හා වෙනත් දීමනා කිහිපයක් ඉල්ලා සිටින අතර දෙවන පාර්ශ්වය විසින් එම ඉල්ලා ඇති වැටුප් හා දීමනා සම්බන්ධව සිය විරෝධතාවය දිගින් දිගටම පළකර සිටී. ඒ අනුව කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් මා වෙත යොමු කර ඇති මෙම බේරුම්කරණයට අදාළ යොමුව කෙරෙහි අවධානය යොමු කරමි. එම යොමුව නිවැරදි බව 2024.07.01 වන දින මෙම බේරුම්කරණ විභාගය ආරම්භයේදීම පළමුවන පාර්ශ්වය විසින් පිළිගෙන ඇත. ඒ අනුව යොමුවේ සඳහන් වන්නේ, "අතීතයට බලපාන පරිදි වැටුප් සැකසීම මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ" ඒ අනුව මෙම බේරුම්කරණ ප්‍රදානය වැටුප් සඳහා පමණක් සීමා වේ. වැටුප යන්නට ව්‍යවස්ථාපිත ගෙවීම් වන EPF හා ETF ඇතුලත් වන නමුත් අනිකුත් දීමනා ඍජුවම ඇතුලත් කිරීමේ හැකියාවක් නොමැත.

එම නිසා මෙම බේරුම්කරණය විභාගය අවසානයේ සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් ලබාදීමට බේරුම්කරු වශයෙන් මා බැඳී සිටින හෙයින් පළමුවන පාර්ශ්වයේ ඉල්ලීම සාධාරණ බැවින් හා දෙවන පාර්ශ්වයට මෙම ආරාවුල නිරවුල් කර ගැනීමට තිබූ අවස්ථා ගණනාවක් නොසැලකිල්ල අනවධානය හා නිසි පරිදි තීරණ නොගැනීම හේතුවෙන් මඟ හැරි තිබීමත් යන කරුණු සලකා පහත පරිදි ප්‍රදානය ලබා දෙමි.

මා වෙත ඉදිරිපත් වූ කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ යොමුවේ සඳහන් වන්නේ " ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 2007,2008 හා 2009 යන වර්ෂ වල දී 25640.00/14 X 475/32290.00 වැටුප් පරිමාණයට බඳවා ගන්නා ලද ආර්. බී. පුංචිහේවා මයා ඇතුලු පහත නම් සඳහන් කෘෂිකර්ම නිලධාරීන් 17 දෙනාගේ වැටුප් පරිමාණ 20490/10 X 325/18 X 475 /32290.00 ලෙස සලකා අතීතයට බලපාන පරිදි වැටුප් සැකසීම මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ." යනුවෙනි. ඒ අනුව පළවන පාර්ශ්වය වෙත අතීතයට බලපාන පරිදි වැටුප් සැකසීම මගින් අසාධාරණයක් සිදුව තිබෙන බව තීරණය කරමි. ඒ අනුව ඔවුන්ට හිමිවිය යුතු සහනයන් පහත පරිදි විස්තර කරමි.

ඒ අනුව 2015.12.31 වන දිනය දක්වා පළමු පාර්ශ්වය විසින් ලබාගත් MM 1-1 ට අදාළ වැටුප 2016.01.01 දින සිට නිසි පරිදි ගැලපීමෙන් අනතුරුව අඛන්ඩව ගෙවිය යුතු බවටත් තීරණය කරමි. ඒ අනුව පළමුවන පාර්ශ්වය විසින් 2025.02.05 වන දින මෙම බේරුම්කරණ විභාගයට ඉදිරිපත් කරන ලද ලේඛනය අනුව එක් එක් අයෙකුට 2016.01.01 සිට 2024.12.31 දින දක්වා පහත පරිදි හිඟ වැටුප් ලබා ගැනීමට හිමිකමක් ඇති බව තීරණය කරමි.

නිලධාරියාගේ නම	හිඟ වැටුප (රුපියල්)
1. ඩී. ආර්. ඩබ්. ක්‍රිශාන්ති (ඩී. ආර්. චේනකා ක්‍රිශාන්ති)	916.308.00
2. සී. ඩී. එම්. ලියනආරච්චිගේ	916,308.00
3. ඒ. එම්. ඒ. යූ.කේ.අබේකෝන්	916,308.00
4. එන්.කේ. ඒ. සී. කොඩිවීර(එන්.කේ.ඒ.චමින්ද)	916,308.00

නිලධාරියාගේ නම	හිඟ වැටුප (රුපියල්)
5. ආර්. බී. පුංචිහේවා	916,308.00
6. බී.ජී. කපිල කුමාර	916,308.00
7. ඩබ්. එම්. ඩී. සී. කේ. වලිසුන්දර	894,211.50
8. බී. ජී. සෙනෙවිරත්න	874,641.00
9. අයි. රණවීර (ඉන්දික රණවීර)	874,641.00
10. ආර්. ඒ. ඩී. කේ. රාජපක්ෂ	839,817.00
11. ජේ. එම්. සුගත් ජයකඩු	593,772.00
(2022.12.31 දින විශ්‍රාම ගොස් ඇති නිසා එදින දක්වා)	
12. එන්. ජේ. දිසානායක	544,567.00
(2022.12.31 දින විශ්‍රාම ගොස් ඇති නිසා එදින දක්වා)	
13. ජේ. එම්. ඒ. කේ. ජයවීර	772,176,00
14. ජේ. එස්. බී. අබේසිංහ	605,051.00
(මෙම අය 2023.07.14 වන දින සේවයෙන් ඉවත්ව ගොස් ඇත)	
15. ඒ. එම්. එස්. අබේරත්න (සමන් අබේරත්න)	689,056.00
16. යූ. ජී. එල්. මෙලානි (යූ. ජී. ලක්ෂිකා මෙලානි)	569,174.50

ඉහත හිඟ මූලික වැටුප ගණනය කර ඇත්තේ 2024.12.31 දින දක්වා වුව ද මහවැලි අධිකාරියේ සක්‍රිය සේවයේ නියුතු නිලධාරින්ගේ හිඟ වැටුප මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් අනතුරුව දෙවන පාර්ශ්වය විසින් ක්‍රියාත්මක කරනු ලබන දින දක්වා වන හිඟ වැටුප ගෙවිය යුතු වේ. එමෙන්ම එය ක්‍රියාත්මක කරනු ලබන දින දක්වාම හිඟ වැටුපට අදාළ සේවකයාගෙන් හා සේවායාගෙන් අයවිය යුතු සේවක අර්ථ සාධක අරමුදලේ හා සේවක භාරකාර අරමුදලේ දායකත්වය ගණනය කොට ගෙවීම දෙවන පාර්ශ්වය විසින් කළ යුතු වේ.

පළමුවන පාර්ශ්වය ඉල්ලා සිටින හිඟ නිවාඩු දීමනා හා හිඟ වෘත්තීය දීමනා සඳහා ඔවුන් හිමිකම් ලබන බව පමණක් ප්‍රකාශ කරමි.

එසේ වුවද අහිමි වූ තීරුබදු සහන හිමි වාහන ආනයන බලපත්‍රයේ වටිනාකම වශයෙන් පළමුවන පාර්ශ්වය විසින් කර ඇති ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි. එසේ වුවද මෙම ප්‍රදානයෙන් පසු වැටුප් තලය නිවැරදිව ගැලපීමෙන් අනතුරුව පවත්නා නීති රීති අනුව වාහන ආනයන පත්‍රයක් ඉල්ලුම් කිරීමේ හැකියාව පළමු පාර්ශ්වය සතුය.

මෙම ප්‍රදානය හේතුවෙන් දෙවන පාර්ශ්වයට දැඩි මූල්‍යාමය බලපෑමක් සිදුවන බව බේරුම්කරු පිළිගනී. ඒ අනුව 2025 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට එක් එක් නිලධාරියාට ලැබිය යුතු හිඟ වැටුපෙන් 1/3 ක් ගෙවීමටත් 2026.12.31 වන දින හෝ ඊට පෙර තවත් 1/3 ක් ගෙවීමටත් 2027.12.31 වන දින හෝ ඊට පෙර ශේෂය ගෙවා අවසන් කිරීමත් කළ යුතු බව තීරණය කරමි. එසේ වුවද යම් හෙයකින් 2025.12.31 වන විට ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබේ නම් 1/3 සීමාව ඉක්මවා ගෙවීම් කිරීමට මෙම තීරණය බාධාවක් නොවන බව ප්‍රකාශ කරමි. යම් හෙයකින් පළමු පාර්ශ්වයේ සමාජිකයෙකු 2027.12.31 ට පෙර විශ්‍රාම ගන්වන්නේ නම් එලෙස විශ්‍රාම යන දින හෝ ඊට පෙර ඔහු වෙත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවීමට දෙවන පාර්ශ්වය කටයුතු කළ යුතු වේ. 2022.12.31 වන දින විශ්‍රාම ගොස් ඇති පළමු පාර්ශ්වයේ නිලධාරීන් දෙදෙනාට හිමි සම්පූර්ණ හිඟ වැටුප හා 2023.07.14 වන දින ඉල්ලා අස්වූ නිලධාරියාගේ සම්පූර්ණ හිඟ වැටුපත් 2025.12.31 දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවට තීරණය කරමි.

අවසාන වශයෙන් මෙම බේරුම්කරණයේදී හෙළි වූ කරුණු අනුව මහවැලි සංවර්ධන අධිකාරියේ 2007 වර්ෂයේ සිට මේ දක්වා සේවය කළ අධ්‍යක්ෂ ජනරාල්වරුන්ට හා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) යන නිලධාරීන්ට එරෙහිව නොසැලකිල්ල හා අනවධානය හේතුවෙන් මහවැලි අධිකාරියට සිදු වූ මූල්‍යාමය හානිය පියවා ගැනීම සඳහා සිවිල් නඩුවක් පවරා අලාභය අයකර ගත යුතු බව ද නිර්දේශ කරමි.

ඒ අනුව මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළ වී මසක් තුළ 2025.12.31 වන දිනට පෙර ගෙවිය යුතු මුදල හා 2022.12.31 වන දින විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් දෙදෙනාගේ හා 2023.07.14 වන දින ඉල්ලා අස්වූ නිලධාරියාගේ හිඟ වැටුප් මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැම්පත් කළ යුතු අතර 2026.12.31 දින හෝ ඊට පෙර ගෙවිය යුතු හිඟ මුදලේ දෙවන කොටස ද, 2027.12.31 දින හෝ ඊට පෙර ගෙවිය යුතු හිඟ මුදලේ තුන්වන කොටස ද නිසි පරිදි ගෙවා අවසන් කොට ඒ බව මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත ලිඛිතව ලියාපදිංචි තැපෑලෙන් දන්වා සිටිය යුතු බව ද වැඩි දුරටත් නියම කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව සහතික කරමි.

නීතිඥ ඩබ්. ඒ. ජයවික්‍රම,
බේරුම්කරු.

2025 ජුනි මස 11 වැනි දින.

EOG 09-0009

මගේ අංකය: IR/COM/05/2019/90.

කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

අංක 2433/33 දරන හා 2025.04.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් මාලබේ, සුසිලාරාම පාර, අංක 487/ඒ හි පදිංචි විජේසේකර පතිරණ සරත් මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් බත්තරමුල්ල, සෙත්සිරිපාය, 4 වන මහල, 11 වන අදියර (නව ලිපිනය: 212/1, බෞද්ධාලෝක මාවත, කොළඹ 07) හි පිහිටි මධ්‍යම සංස්කෘතික අරමුදල අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A16/2021 දරන හා 2025.03.17 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් මධ්‍යම සංස්කෘතික අරමුදල වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A16/2021 දරන දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2026.04.24 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 අගෝස්තු මස 20 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

"අ" ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත

බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

ලිපිනය - මධ්‍යම සංස්කෘතික අරමුදල
212/1, බෞද්ධාලෝක මාවත, කොළඹ 07

දිනය - 2025.06.24

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටයි.

2025.04.25 දිනැති අංක 2433/33 දරන *ගැසට් පත්‍රයේ* පල කරන ලද්දාවූ ද ඩබ්. පී. සරත් මයා සහ මධ්‍යම සංස්කෘතික අරමුදල බැදී සිටින්නාවූ ද 2025.03.17 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන - අධ්‍යක්ෂ ජනරාල්
මධ්‍යම සංස්කෘතික අරමුදල

පිටපත - විජේසේකර පතිරණ සරත්
අංක 487/ඒ, සුසිලාරාම පාර, මාළඹේ.

EOG 09-0010

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.